**කලවාන ප්‍රාදේශීය සභාව - 2023**

---------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කලවාන ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කලවාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.5,821,876ක් වූ සංවර්ධන ව්‍යාපෘති ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ශේෂය තුළ වටිනාකම රු.12,835,000ක් වූ මෝටර් රථ ඇතුළත්ව තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය අනුව සභා ගොඩනැගිල්ලේ වටිනාකමට වඩා රු.27,471,000ක් අඩුවෙන් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | සභාව සතු ප්‍රමාණය හඳුනාගත නොහැකි වූ ඉඩම් 65ක හා ඒවායේ පිහිටි ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළ කඩකාමර කුලී ආදායම රු.170,200ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | එළිමහන් කඩකාමර සඳහා හිඟහිටි කුලී රු.224,395ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව 2023 දෙසැම්බර් 31 දිනට හිමිකම් ශේෂය සහ ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය අනුව එදිනට එම ශේෂය අතර රු.100,000ක වෙනසක් පැවැතිණි. | -එම- | -එම- |
| (ඌ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 09ක ශේෂ සහ උපයෝගී ලේඛන අනුව එදිනට එම ශේෂ අතර රු.17,023,067ක වෙනසක් විය. | ඉදිරියේදී උපයෝගී ලේඛන නිවැරදි කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන සකස් කරමි. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 177(1) පටහැනිව, 2023 සැප්තැම්බර් මාසයේ ආදායම් නිළධාරීන් රැස් කළ රු.317,204ක් ප්‍රේෂණය කිරීමට 2024 ජනවාරි දක්වා ප්‍රමාද කර තිබුණි. | සම්පූර්ණ මුදල් අය කර ඇත. නිලධාරියා සම්බන්ධව ඉදිරි කටයුතු කිරීමට පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | නැවත කාලය දීර්ඝ කර නොගත් සංවර්ධන බලපත්‍ර 37ක් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | මෙ සම්බන්ධයෙන් බලපත්‍ර හිමියන් දැනුවත් කර ඇත. | නාගරික සංවර්ධන අධිකාරී පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,358,684ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,106,350ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එන රු.47,340ක අහරු චෙක්පත හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | කඩිනමින් නිරවුල් කළ යුතු වේ. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම රු. | බිල්කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | 2022 ඇස්තමේන්තුගත ආදායම රු. | බිල්කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
|---|---|---|---|---|---|---|---|---|
| වරිපනම් හා බදු | 3,463,645 | 3,570,625 | 3,268,829 | 3,643,614 | 4,192,877 | 3,289,245 | 2,930,594 | 3,633,626 |
| කුලී | 8,232,800 | 8,271,682 | 6,831,959 | 14,205,431 | 9,941,213 | 10,396,796 | 8,169,855 | 12,593,822 |
| බලපත්‍ර ගාස්තු | 1,011,500 | 1,089,635 | 1,089,635 | - | 1,541,790 | 7,731,571 | 7,731,571 | - |
| වෙනත් ආදායම් | 3,875,400 | 4,546,226 | 4,534,314 | - | 3,064,607 | 3,956,448 | 3,956,448 | - |
| | 16,583,345 | 17,478,168 | 15,724,737 | 17,849,045 | 18,740,487 | 25,374,060 | 22,788,468 | 16,227,448 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.1,652,455ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වර්ෂ 05කට වඩා පැරණි රු.878,621ක ශේෂයක් පවතී. | අවසාන නිවේදන නිකුත් කර ඇත. තවදුරටත් හිඟ පවතින වරිපනම් දේපළ සඳහා පනත අනුව කටයුතු කරමි. | හිඟ ආදායම් නොපමාව රැස් කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.615,761ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 03කට වඩා පැරණි රු.599,828ක ශේෂයක් පවතී. | හිඟ අක්කර බදු අය කර ගැනීමට කටයුතු කරමි. | -එම- |
| (ඇ) | මස් හා මාලු වෙළඳ සැල්වලින් අයවිය යුතු රු.464,947ක් අයකර නොතිබුණි. | එම මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | -එම- |
| (ඈ) | ආයතන 34කට අයත් දැන්වීම් පුවරු 72ක් සඳහා අයවිය යුතු රු.673,150ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර නොතිබුණි. | ආයතන දැනුවත් කිරීමේ ලිපි මේ වන විට යොමු කර ඇත. | -එම- |
| (ඉ) | ත්‍රීරෝද රථ සංගම් 05කට අයත් ත්‍රීරෝද රථ 133කින් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළ ගාස්තු රු.319,000ක් අයකර නොතිබුණි. | ලේඛනයේ නම් සඳහන් අක්‍රීය සාමාජිකයින් ඉවත් කරන ලදී. මෙතෙක් පැවති හිඟයෙන් රු.56,400ක් අය කර ඇත. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය තුළ අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1080ක් පමණ විධිමත් හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් තොරව බැහැර කර තිබුණි. එමෙන්ම, 2022 අගෝස්තු මස ලද රු.950,000ක් වූ බෙලර් යන්ත්‍රය 2024 ජනවාරි වන විටත් නිෂ්කාර්යයව පැවැතිණි. | කසළ වෙන් කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකර බේලර් යන්ත්‍රය උපයෝජනය කිරීමට අපේක්ෂා කරමි. | විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු වේ. |

### 3.2 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ වැඩ බලන ලේකම්වරයාට 2023 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා වැඩ බැලීමේ දීමනා ලෙස රු.114,345ක් ගෙවා තිබියදී, වැඩ බැලීම සඳහා සභාවට පැමිණි දින වෙනුවෙන් රු.60,500ක සංයුක්ත දීමනා ද ගෙවා තිබුණි. | වැඩ බැලීමේ දීමනාව ලබා ගැනීම, සංයුක්ත වියදම් හෝ ගමන් වියදම් ලබා ගැනීමට බාධාවක් නොවේ. | වැඩ බැලීමේ දීමනාව ලබන නිලධාරියෙකුට එම රාජකාරිය වෙනුවෙන් සංයුක්ත දීමනා ගෙවීම නොකළ යුතු වේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පහළකන්ද, පාලින්දගොඩ පර්චස් 160ක් වූ සුසාන භූමියෙන් පර්චස් 124ක්ම අනවසරකරුවන් විසින් 1997 වර්ෂයේ සිට අත්පත් කරගෙන තිබුණද, ඊට එරෙහිව කිසිඳු නීතිමය පියවරක් මේ දක්වාම ගෙන නොතිබුණි. | නීති උපදෙස් ලබාගෙන ඇති අතර ඒ අනුව කටයුතු කරමි. | අනවසරකරුවන් ඉවත් කිරීමට නීතිමය පියවර ගත යුතු වේ. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.2 වගන්තියට පටහැනිව, මාස 03කට අඩු කර්මාන්තයක් සඳහා මිල විචලන ලෙස රු.75,738ක් ගෙවා තිබුණි. 2022 වර්ෂයේ වැඩ නිම කළ, එම ටැංකිය වෙත ප්‍රවේශ වීමට කුකුලේගම ජල විදුලි බලාගාරය | වැඩිපුර ගෙවීම් අදාළ පාර්ශවයෙන් අය කිරීමට කටයුතු කරමි. 2024 අප්‍රේල් සිට ගලිවල සඳහා ගලි බැහැර කිරීම | වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීමට හා වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | විසින් අවසර නොදීමෙන් ඒ වෙනුවෙන් වැය කළ රු.902,100ක් නිෂ්ඵල වියදමක් වී තිබුණු අතර, මළ අපද්‍රව්‍ය බැහැරලීමේ ගැටළුව ද විසඳී නොතිබුණි. | ආරම්භ කර ඇත. | |
| (ආ) | කනේගල පුවක්පැළකැටිහේන මාර්ගය සංවර්ධනය කිරීමේදී රු.15,543ක් වැඩිපුර ගෙවා තිබුණි. | ගෙවා ඇති මුදල ආපසු අයකර ගනිමි. | වැඩිපුර ගෙවීම් ආපසු අයකළ යුතු වේ. |

**3.5 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අලුත්වැඩියා කළ හැකි ට්‍රැක්ටර් 05ක් මාස 06ත් වසර 03ත් අතර කාලයක සිට අභාවිතව පවතී. | ප්‍රතිපාදන ලද පසු අලුත්වැඩියා කිරීමට කටයුතු කරමි. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |